# කොටි පරදවා සාමය උදාකරීම

අද රාජ්‍ය නොවන සංවිධානවල සේවය කරන බටහිර ගැත්තන් ඇතුළු විජාතික බලවේගවල සාමාජිකයන් හා නියෝජිතයන් හැරුණුකොට අන් සියල්ලෝම පාහේ කොටි යනු පුම්බන ලද බළලුන් බව තේරුම්ගෙන ඇත. බටහිර ගැත්තන් නොදැන සිටිය ද බටහිර දේශපාලනඥයන් හා අදාළ නිලධාරීන් ඒ බව දැනගෙන බොහෝ කල්ය. එයට හේතුව කොටි පුම්බන ලද්දේ තමන් විසින් බව මොවුන් දැනගෙන සිටීමය. එහිදී කොටින්ගේ බටහිර හොරණෑව වූ බොරු බෙගල් කොම්පැණිය හෙවත් බීබීසිය, විශේෂයෙන්ම එහි අගු පිලේ ඇති සිංහල හා දෙමළ සේවා, විසින් රඟපාන ලද භූමිකාව කා හටත් මතක තිබිය යුතුය. කොටි යනු පුම්බන ලද නිවටයන් පිරිසක් බව අප බොහෝ කලකට පෙර ප්‍රකාශ කළ විට බොහෝ දෙනා අපට සිනහසුණහ. ඔවුන්ගෙන් ඇතැමකු කියා සිටියේ ප්‍රභාකරන් යනු අති විශිෂ්ට යුද්ධ උපක්‍රමිකයකු බවත් කොටි සංවිධානය අනභිබවනීය බවත්ය. ලෝකයේ හොඳම ගරිල්ලා සංවිධානය කොටි සංවිධානය බව කී මේ ඊනියා යුද්ධ විශේෂඥයෝ ලංකාණ්ඩුවේ හමුදාවන්ට කිසි දිනෙක එවැනි ගරිල්ලා සංවිධානයක් පරාජය කළ නොහැකි බව කීවෝ ය. ඒ අතර විජාතික බලවේග සැලැස්මකට අනුව තම කටයුතු ගෙන ගියේ ය. එක් පැත්තකින් හමුදාව අධෛර්යවත් කිරීමට ඔවුහු කටයුතු කළහ. ඊනියා සම්භාව්‍ය කලා කෘති මගින් හමුදාවේ මානසිකත්වය කඩාවට්ටන පණිවුඩ ජනතාව අතරට යැවිණි. රාජ්‍ය නොවන සංවිධාන මගින් ඊනියා සාම සම්මන්ත්‍රණ,වැඩමුළු මෙරට පමණක් නොව පිටරටද සංවිධානය කරන ලදී. මන්ත්‍රීවරු ඇමැතිවරු බුරුතු පිරින් පිටරට සංචාර සඳහා පිටත් වූහ. දේශපාලනඥයන්ගේ හමුදා නිලධාරීන්ගේ සෙබළුන්ගේ හා ජනතාවගේ මනස් ඊනියා යුද්ධයට එරෙහිව සකස් කිරීමට උත්සාහ ගැනිණි. එදා හමුදා කඳවුරුවලට ගොස් නිලධාරීන් හා සෙබළුන් ඇමැතීමේ අවස්ථාව හිමිවූයේ රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා ගැටුම් නිරාකරණ විශේෂඥයන්ටය. අද ද මේ තත්ත්වයේ විශේෂ වෙනසක් දක්නට නොමැත. එහෙත් අද කොටි පරාජය කළ යුතු බව කියන්නන්ට ද අතරින් පතරවත් හමුදා කඳවුරුවලට යෑමේ භාග්‍යය උදාවී ඇත. විජාතික බලවේග ශ්‍රී ල නි පක්‍ෂයේ නායකත්වය චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට පත්කිරීම මගින් ඒ පක්‍ෂයේ ජාතිකත්වය නැති කිරීමට උත්සාහ ගත්හ. ඉන් පෙරද බණ්ඩාරනායක පවුලට එක්වූ බෑණාවරුන් ලවා එසේ කරවීමේ උත්සාහ තිබිණි. එහෙත් ශ්‍රී ල නි පක්‍ෂයේ ප්‍රතිපත්ති තාවකාලිකව වෙනස් කිරීමට නායක නායිකාවන්ට හැකිවුවද ඒ පක්‍ෂයේ ඡන්ද පදනම විසින් තරමක් කල්ගතවී හෝ පක්‍ෂය නැවත නැවතත් ජාතිකත්වය දෙසට ගැනෙයි. 2005 දී ද සිදුවූයේ එයයි. එහෙත් අපි මෙයින් සෑහීමකට පත්නොවෙමු. තව කළ යුතු වැඩ රාශියක් වෙයි. විජාතික බලවේග මුළුමනින්ම පරදා දෙමළ ජාතිවාදය ද පැරදවීමෙන් තොරව සාමය උදාකරලිය නොහැකිය. සාමය උදාකරලීම සඳහා කොටි මුළුමනින්ම පැරදවීම අනිවාර්ය වුවකි. අද සාමයට හරස් වී සිටින්නේ කොටි ය. එසේ නම් කොටි පැරදවීමෙන් තොරව සාමය උදාකරලිය නොහැකිය.

අප එක් කරුණක් මතක තබා ගත යුතුය. කොටි සංවිධානය මුළුමනින්ම පරාජය වනු දැකීමට කොටින්ට සෘජුව හෝ වක්‍රව හෝ ආධාර කරන බටහිර රටවල් ජපානය හා ඉන්දියාව පමණක් නොව මෙරට කොටින්ට විරුද්ධ දෙමළ දේශපාලන පක්‍ෂ හා වාමාංශික යැයි කියාගන්නා ඇතැම් දේශපාලන පක්‍ෂ ද අකමැති වෙයි. එයට හේතුව කොටි මුළුමනින්ම පරාජය වුවහොත් දෙමළ ජාතිවාදයට කේවල් කිරීම සඳහා ශක්තියක් නැති බව ඒ දේශපාලන සංවිධාන අන් කාහටත් වඩා හොඳින් දන්නා බැවින්ය. අද දෙමළ ජාතිවාදයට පැවැත්මක් ඇත්තේ ප්‍රභාකරන් නිසා ය. ඔහු මියගිය දා ඇතැම් විට කොටි වෙනත් අයකු මගින් ඒ කාර්යය ඉටුකර ගැනීමට මාන බලනු ඇත. එහෙත් කොටි සංවිධානයේ වෙනත් එවැන්නකු නොමැත. එබැවින් ප්‍රභාකරන් මියගිය ද බටහිරයන් හා විජාතික බලවේග ඒ බව සඟවා ප්‍රභාකරන්ගේ නායකත්වයෙන් ඒ සංවිධානය පවත්වාගෙන යෑමට වුවද ඉඩකඩක් ඇත. දෙමළ ජාතිවාදීන්ට සැබෑ ප්‍රශ්නයක් තිබිණි නම් එවැනි තත්ත්වයක් උදා නොවනු ඇත. ඇත්තේ ව්‍යාජ ප්‍රශ්නයක් බැවින් ඒ පවත්වාගෙන යෑම සඳහා ආයුධ ගත් පිරිසක් ඇති බව පෙන්වීමේ අවශ්‍යතාව වෙයි.

කොටි සංවිධානය දුර්වල බව අද කුඩා ළමයකුට වුව ද වැටහෙයි. බටහිර විජාතික බලවේගවලට අවශ්‍ය වන්නේ කෙසේ හෝ හමුදා මෙහෙයුම් නැවැත්වීමටය. ඒ සඳහා ඔවුහු නොයෙකුත් උප්පරවැට්ටි කරති. ඊනියා සාම සාකච්ඡා ඇරඹීම එ. ජා. පාක්‍ෂිකයන් පිරිසක් ආණ්ඩුවට යවා එමගින් ශ්‍රී ල නි පක්‍ෂයේ ජාතිකත්ව ප්‍රතිපත්ති දියකර හැරීම, ආණ්ඩුවට බලපෑම් කිරීම ආදිය ඉන් සමහරකි. කොටි සංවිධානයට මුලදීම ආයුධ පුහුණුවක් ලබාදුන් ඉන්දියාව වඩමාරච්චි සටන අවස්ථාවෙහි දී පරිප්පු දේශපාලනය ඔස්සේ ලංකාණ්ඩුවට තර්ජනය කර හමුදා මෙහෙයුම්

© Prof. Nalin De Silva

නැවැත්වීය. අද ද ඉන්දියාව විවිධ ක්‍රම මගින් ලංකාණ්ඩුවට බලපෑම් කරයි. එදා ඩික්සිත් කළ කාර්යය අද නිරූපමා රාවෝ කිරීමට උත්සාහ දරන්නී ය. එහෙත් ඇය ඩික්සිත් තරම් දක්ෂ නැති බව පැහැදිලිය. අනුර බණ්ඩාරනායක මහතා ඉන්දියාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ දී කරන ලද ප්‍රකාශයෙහි ඇත්තේ අසත්‍යයක් නොවේ.

නෝර්වේ රාජ්‍යය සිය සුපුරුදු වූ කොටි නියෝජිත ප්‍රතිපත්තිය දිගින් දිගටම කරගෙන යයි. ඊනියා සාම සාකච්ඡාවට ඔවුන් දැනටමත් දින නියම කර ඇත. ආණ්ඩුව කොන්දේසි විරහිතව කොටි සමග සාකච්ඡාවලට සූදානම් යැයි තමන්ට පැවසී යැයි නෝර්වේ කොටි නියෝජිතයෝ පවසති. ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල මහතා එය ප්‍රතික්ෂේප කරයි. ඒ කුමක් වුවත් අද නෝර්වේ කොටි නියෝජිතයන්ට අවශ්‍ය කොටි සංවිධානයට තම ශක්තිය යම් ප්‍රමාණයකින් හෝ වර්ධනය කරගැනීමට තවත් විරාමයක් ලබාදීම ය. ඊනියා සටන් විරාම යනු කොටි සංවිධානය පවත්වාගෙන යෑමේ උපක්‍රමයක් පමණකි. කොටින්ට කිසි දිනෙක සටන් කර ඊළමක් ලබාගැනීමට නොහැකි බව අපි දිගින් දිගට ම කියා ඇත්තෙමු. කොටින්ට ඊළම දිනාගත හැක්කේ සාකච්ඡා මාර්ගයෙන් පමණකි. එහෙත් කොටි සංවිධානය දිගින් දිගටම ක්‍රියාකර ඇත්තේ තමන් සාකච්ඡාවලට වඩා සටන්වලට කැමැත්තක් ඇති බව පෙනෙන අයුරින් ය. ඒ හුදෙක් ඔවුන්ගේ ආයුධවල හා ආයුධ පුහුණුවෙහි නැති ශක්තියක් ලෝකයට පෙනෙන්නට ය. රනිල් වික්‍රමසිංහගේ ඊනියා සටන් විරාම ගිවිසුම හෙවත් රට පාවාදීමේ ගිවිසුම අත්සන් කෙරුණේ මේ උපක්‍රමයෙහි පියවරක් ලෙසය. කොටි සටන් මාවතෙන් ඉවතට ගෙන ඊනියා සාමයක් උදාකරලූ තැනැත්තා ලෙස රනිල් වික්‍රමසිංහ මහතා හඳුන්වාදෙනු ලැබිණි.

ඒ ඊනියා සටන් විරාම ගිවිසුම අද තුට්ටුවක් නොවටිනා ලියවිල්ලක් පමණකි. ඊනියා සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කළ කොටි ඉල්ලන් කෑවෝය. අද ආණ්ඩුව ක්‍රියාකළ යුත්තේ ඊනියා සටන් විරාම ගිවිසුමක් නැති බව තේරුම් ගනිමිනි. අද එය ඒ තත්ත්වයෙන්ම තිබීමට ඉඩහැරිය යුතු ය. ආණ්ඩුව ඊනියා සටන් විරාම ගිවිසුමෙන් ඇත්වීම හෝ එය අහෝසි කිරීම හෝ වෙනුවට කළ යුත්තේ එවැන්නක් නැති බව කොටි විසින් පෙන්නුම් කර ඇති බව කීමය. කොටි ඒ බවට වචනයෙන් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර නැති වුවද ඔවුන්ගේ ක්‍රියාවලින් ඒ බව සනාථ වී ඇත. නැවත නැවතත් මේ සටන් විරාම විහිළුව නොකළ යුතුය. එපමණක් නොව ඒ විහිළුව කිරීමට නැවත නැවතත් ඉදිරිපත් වන නෝර්වේ රාජ්‍යය ද නොසළකා හැරීමට ලංකාණ්ඩුව ක්‍රියා කළ යුතු ය. නෝර්වේ අසමත් පහසුකම් සපයන්නෙකි. නෝර්වේ නියෝජිතයන්ට හෝ ඊනියා සටන් විරාම නිරීක්ෂණ කමිටුවට හෝ දක්ෂකමක් නැති බව ලෝකයාටම පෙනී ගොස් ඇත. නිරීක්ෂණ කමිටු සාමාජිකයන් දක්ෂතාවක් දක්වා ඇත්තේ පොළොන්නරුව ප්‍රදේශයේ සංචාරක ලැගුම්හල් නිරීක්ෂණය කිරීමට ය. අද ආණ්ඩුව ක්‍රියා කළ යුත්තේ නෝර්වේ හා අනෙක් රටවලටද ඊනියා සටන් විරාම ගිවිසුම යටතේ තවදුරටත් භූමිකාවක් නැති බව කාට කාටත් තේරුම් ගැනීමට ඉඩ සැලැස්වෙන ආකාරයකට ය. සෝල්හයිම්ලාගේ ප්‍රකාශන ප්‍රතිචාර දැක්වීමට තරම්වත් වටිනා දේ නොවන බවට ප්‍රකාශයක් ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල මහතා කෙළේ නම් මැනවි.

අද කිරීමට ඇත්තේ හමුදා මෙහෙයුම් තව තවත් ඉදිරියට ගෙනයෑම පමණකි. කොටි යනු නිවට කැණහිළුන් පිරිසක් බවත් ඔවුන්ට කළ හැක්කේ බෝම්බ ගැසීම හා සිය දිවි නසාගැනීම පමණක් බවත් මේ වන විට බොහෝ අයට අවබෝධ වී අවසන්ය. නැගෙනහිර පළාතෙන් කොටි සම්පූර්ණයෙන් ශුද්ධකර කිලිනොච්චි පැත්තෙන් ද කොටින්ට එරෙහි ප්‍රහාරයක් ඇරඹිය යුතුය. කොටි අලිමංකඩ හා කිලිනොච්චිය අතර තීරුවකට කොටුකර සාමාන්‍ය ජනතාවට ඒ ප්‍රදේශයෙන් ඉවත්වන ලෙස ඉල්ලා බංකර් නාශක බෝම්බ හෙළන ගුවන් යානා යොදාගැනීම ඉක්මණින්ම කළ යුතු කාර්යය වෙයි. මම යුද්ධ උපක්‍රම නොදනිමි. එහෙත් මට වැටහෙන්නේ ඒ පරිදිය. අද ආණ්ඩුව බටහිරයන් හෝ ඉන්දියාව හෝ වෙනත් අයකු හෝ කියන දෙයට සවන් නොදිය යුතුය. තම රටවල ස්වෛරීභාවයට තර්ජනයක් එල්ල වූ අවස්ථාවල ඔවුන් ක්‍රියාකර ඇත්තේ කෙසේ දැයි අපි දනිමු. ඉන්දියාව සික්වරුන්ගේ ඉතාමත්ම පූජනීය ස්ථානය වූ රන් දෙවොල පවා ආක්‍රමණය කිරීමට පසුබට නොවීය. ඇමරිකාවේදී කොන්ඩි නමින් බුෂ් විසින් හැඳින්වෙන කොන්ඩලීසා රයිස් හා ඇගේ නිලධාරීන් මහින්ද රාජපක්ෂ මහතාට විවිධ බලපෑම් කරනු ඇත. එහෙත් එතුමා කළ යුතුව ඇත්තේ ලංකාව ස්වෛරී රාජ්‍යයක් බව ඔවුන්ට මතක් කර දීම පමණය. රනිල් හා චන්ද්‍රිකා යුවළ ක්‍රියා කෙළේ ස්වෛරී රාජ්‍යයක නායකයන් ලෙස නොවේ. ඔවුන් බලයෙන් ඉවත් කිරීමට මෙරට සිංහල ජනතාව පියවර ගෙන ඇත්තේ එබැවිනි. මහින්ද රාජපක්ෂ මහතා ලංකාව යනු ස්වෛරී රාජ්‍යයක් ය යන මන්ත්‍රය නිතර ජප කළ යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva